# මුල් වරට හැඳුනුම්පතක් ලබාගැනිම

**අවශ්‍ය සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකාවේ පදිංචි පුරවැසියෙකු විය යුතුය.

(ආ) වයස අවුරුදු 16 සම්පූර්ණ විය යුතුය.

**අයදුම්පතක් ලබා ගැනීම**

1. අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරී
2. වතු පදිංචිකරුවන් අදාළ වතු අධිකාරී
3. පාසල් අයදුම්කරුවන් අදාළ පාසලේ විදුහල්පතිවරයා හෝ පරිවේණාධිපති

ඒ අනුව තමා ලබාගත් අයදුම්පත සම්පූර්ණ කර අවශ්‍ය ලිපි ලේඛන සමග අයදුම්පත ලබාගත් ඉහත සඳහන් නිලධාරින් වෙතට භාරදිය යුතු වේ.

**මුල්වරට හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.**

1. සම්පූර්ණ කරන ලද පු.ලි.දෙ.වි.1 ආකෘති පත්‍රය (සුදු පාට හෝ සුදු පාටට හුරු)
2. අයදුම්කරු වයස අවු. 50 ට අඩුනම් අනිවාර්යයෙන්ම උප්පැන්න සහතිකය හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන අනුමාන වයස් සහතිකය

- අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කරන අයදුම්කරුවකු සඳහා උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ අනුමාන වයස් සහතිකයෙහි සඳහන් වර්ෂයෙහි ජූලි මස පළමු දිනයයි.

  අයදුම්කරුගේ වයස අවු. 50 ට වැඩිනම් ද, උප්පැන්න සහතිකය අනුමාන වයස් සහතිකය නොමැතිනම් පමණක් ලේඛන සෙවීමේ හිස් ප්‍රතිඵල සටහන හා උපන් දිනය තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් සමග පහත දැක්වෙන විකල්ප ලේඛන දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කළ යුතුය.

- පාසල් හැරයාමේ සහතිකය.
- බෞතිස්ම සහතිකය.
- අයදුම්කරුගේ/අයදුම්කාරියගේ උපන්දිනය සඳහන්ව ඇති දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්
- උප්පැන්න සහතිකයේ උපුටාගත් කොටස
- ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය (උපන්දිනය ඇතුළත්ව තිබේනම්)
- වතු හැරයාමේ සහතිකය (උපන් දිනය ඇතුළත්ව තිබේනම්)
- ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල සහතික කළ පිටපත්
- වතු අධිකාරී විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කාඩ්පත
- ජන්ම පත්‍රය (හඳහන)

1. විදේශයක උපත ලද්දකු නම් ශ්‍රී ලංකාවේ පුරවැසි බව ලබා ගත් ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ පුරවැසි සහතිකය සහ එහි ඡායා පිටපත.
2. අයදුම්කරු විවාහක කාන්තාවක් වන විට ස්වාමිපුරුෂයාගේ නම ලබාගැනීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපත.
3. 1 ⅜'' X ⅞'' ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 5 ක්
4. මුද්දර ගාස්තු:

- වයස අවුරුදු 17 ට අඩු අයදුම්කරුවන් සඳහා රුපියල් 3.00 ක් වටිනා මුද්දර
- වයස අවුරුදු 17 ට වැඩි අයදුම්කරුවන් සඳහා රුපියල් 13.00 ක් වටිනා මුද්දර

තම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ සේවා සහතිකය ද (මාස 03 ක් ඇතුළත ලබා ගත්), වෘත්තීයමය සුදුසුකම් ලත් අය එම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය. උදා: වෛද්‍ය , ගණකාධිකාරි , නීතිඥ , ඉංජිනේරු වැනි වෘත්තීය සුදුසුකම් සඳහා උපාධි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- ව්‍යාපාරිකයන් ඒ සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**<u>පූජ්‍යත්වය සනාථ කිරීම සඳහා -</u>**

- බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය
- දසසිල් මාතාවක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවීමේ සහතිකය
- ඉස්ලාම් පූජකවරුන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- හින්දු පූජකවරුන් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- කතෝලික පූජකවරුන් අදාළ පැවිදි නිකායේ ප්‍රධානීන් වෙතින් ලබාගත් සහතිකය(

| හැඳුනුම්පත සංශෝධනය කිරීම |
| --- |

**හැඳුනුම්පතක අන්තර්ගත කරුණු සංශෝධනය සඳහා හෝ පළුදු වී ඇති හැඳුනුම්පතක් වෙනුවෙන් නව හැඳුනුම්පතක් ලබාගැනීම**

**අයදුම්පතක් ලබා ගැනීම**

1. අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරී
2. වතු පදිංචි කරුවන් අදාල වතු අධිකාරී

**හැඳුනුම්පත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන**

1. සම්පූර්ණ කරන ලද පු.ලි.දෙ.වි.08 ආකෘති පත්‍රය (රෝස පාට හෝ රෝස පාටින් අකුරු මුද්‍රිත)
2. දැනට භාවිත කරන හැඳුනුම්පත
3. 1 ⅜" X ⅞" ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 05 ක්
4. රුපියල් 15 ක් වටිනා මුද්දර
5. දැනට භාවිත කරන හැඳුනුම්පතේ සඳහන් නම, උපන්දිනය හා අදාළ විස්තර වෙනස් වී හෝ අපැහැදිලි නම්, උප්පැන්න සහතිකය මුල් පිටපත හෝ අනුමාන වයස් සහතිකය හෝ ලේඛන සෙවීමේ හිස් ප්‍රතිඵල සටහන ඉදිරිපත් කළ යුතුය. (ලේඛන සෙවීමේ හිස් ප්‍රතිඵල සටහන් ඉදිරිපත් කරන විට ඒ සමග උපන්දිනය තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් සමග පහත දැක්වෙන විකල්ප ලේඛන දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කල යුතුය).

- පාසල් හැරයාමේ සහතිකය.
- බෞතිස්ම සහතිකය.
- අයදුම්කරුගේ/අයදුම්කාරියගේ උපන්දිනය සඳහන්ව ඇති දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්
- උප්පැන්න සහතිකය උපුටාගත් කොටස
- ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය (උපන්දිනය ඇතුළත්ව තිබේනම්)
- වතු හැරයාමේ සහතිකය (උපන් දිනය ඇතුළත්ව තිබේනම්)
- ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල සහතික කළ පිටපත්
- වතු අධිකාරී විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කාඩ්පත
- ජන්ම පත්‍රය (හඳහන)

1. විවාහක කාන්තාවක්, තම ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කිරීම සඳහා ඉල්ලා සිටී නම් විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.
2. දැනට භාවිත කරන හැඳුනුම්පතේ අංකය අපැහැදිලි නම් එම අංකය භාවිතා කළ බවට සනාථ වන ලියකියවිලි (රියදුරු බලපත්, ගුවන් ගමන් බලපත්‍රවල සහතික කළ පිටපත්, පැරණි හැඳුනුම්පතේ ඡායා පිටපතක්, බැංකු පාස්පොත)
3. තම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ සේවා සහතිකය ද (මාස 03 ක් ඇතුළත ලබා ගත්), වෘත්තීමය සුදුසුකම් ලත් අය එම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය. උදා: වෛද්‍ය , ගණකාධිකාරි , නීතිඥ , ඉංජිනේරු වැනි වෘත්තීය සුදුසුකම් සඳහා උපාධි සහතිකය ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාරිකයන් ඒ සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
4. පූජ්‍යත්වය සනාථ කිරීම සඳහා -

- බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය
- දසසිල් මාතාවක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවීමේ සහතිකය
- ඉස්ලාම් පූජකවරුන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- හින්දු පූජකවරුන් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- කතෝලික පූජකවරුන් අදාළ පැවිදි නිකායේ ප්‍රධානීන් වෙතින් ලබාගත් සහතිකය

1. උපැවිදි බව ලබා ඇත්නම් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන උපැවිදි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

වෙනත් නම් ඇතුළත් කිරීමට අවශ්‍ය නම් එම නම භාවිත කළ බවට ලිඛිත සාක්ෂි සහ භාවිතා කරන නම් දෙකම ඇතුළත් කර සාමදාන විනිශ්චයකරුවකුගෙන් ලබා ගත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

ජාතික හැඳුනුම්පතේ පිටපතක් ලබා ගැනීම

**නැතිවීම හේතු කොටගෙන හැඳුනුම්පතක අනුපිටපතක් ඉල්ලීම**

**අයදුම්පතක් ලබා ගැනීම**

1. අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරී
2. වතු පදිංචි කරුවන් අදාළ වතු අධිකාරී

**ජාතික හැඳුනුම්පතේ අනුපිටපතක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන**

1. සම්පූර්ණ කරන ලද පු.ලි.දෙ.වි. 7 ආකෘති පත්‍රය (කොළ පාට හෝ කොළ පාටින් අකුරු මුද්‍රිත)
2. හැඳුනුම්පත නැතිවූ බවට පොලීසියේ කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත (මාස 06 ක් නොඉක්මවූ )
3. 1 ⅜'' X ⅞'' ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 05 ක්
4. රු. 15 ක් වටිනා මුද්දර
5. උප්පැන්න සහතිකය, අනුමාන වයස් සහතිකය හෝ ලේඛන සෙවීමේ හිස් ප්‍රතිඵල සටහන් වල මුල් පිටපත්.

(ලේඛන සෙවීමේ හිස් ප්‍රතිඵල සටහන් ඉදිරිපත් කරන විට ඒ සමග උපන්දිනය තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් සමග පහත දැක්වෙන විකල්ප ලේඛන දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කල යුතුය).

- පාසල් හැරයාමේ සහතිකය.
- බෞතිස්ම සහතිකය.
- අයදුම්කරුගේ/අයදුම්කාරියගේ උපන්දිනය සඳහන්ව ඇති දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්
- උප්පැන්න සහතිකයේ උපුටාගත් කොටස
- ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය (උපන්දිනය ඇතුළත්ව තිබේනම්)
- වතු හැරයාමේ සහතිකය (උපන් දිනය ඇතුළත්ව තිබේනම්)
- ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල සහතික කළ පිටපත්
- වතු අධිකාරී විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කාඩ්පත
- ජන්ම පත්‍රය (හඳහන)

1. තම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ සේවා සහතිකය ද (මාස 03 ක් ඇතුළත ලබා ගත්), වෘත්තීයමය සුදුසුකම්ලත් අය එම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය. උදා: වෛද්‍ය , ඉංජිනේරු වැනි වෘත්තීය සුදුසුකම් සඳහා උපාධි සහතිකය ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාරිකයන් ඒ සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපත ඉදිරිපත් කළ යුතුය.
2. නැතිවූ හැඳුනුම්පතෙහි අංකය භාවිතා කළ බවට සනාථ කෙරෙන ලියකියවිලි උදා. බැංකු පාස් පොත, ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය, පැරණි හැඳුනුම්පතේ ඡායා පිටපත වැනි ලේඛනවල සහතික කළ පිටපත්
3. පූජ්‍යත්වය සනාථ කිරීම සඳහා -

- බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය
- දසසිල් මාතාවක් නම් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවීමේ සහතිකය
- ඉස්ලාම් පූජකවරුන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- හින්දු පූජකවරුන් හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකය
- කතෝලික පූජකවරුන් අදාල පැවිදි නිකායේ ප්‍රධානීන් වෙතින් ලබාගත් සහතිකය

උපැවිදි බව ලබා ඇත්නම්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන උපැවිදි සහතිකය

එක් දින සේවය යටතේ හැඳුනුම්පතක් ලබා ගැනීම

**එක් දින සේවය යටතේ හැඳුනුම්පතක් ලබා ගැනීම.**

හදිසි අවශ්‍යතාවයන් සඳහා කඩිනමින් හැඳුනුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙනුවෙන් එක් දිනක් තුළ හැඳුනුම්පත් නිකුත් කිරීමේ සේවයක් 2003.09.01 දින සිට ආරම්භ කර ඇත. මේ සඳහා එක් අයදුම්පතක් වෙනුවෙන් රු. 500 ක රජයේ අනුමත ගාස්තුවක් අය කරනු ලැබේ.

**අයදුම්පත් සහතික කිරීම.**

- අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාමනිලධාරී වරයා හා ප්‍රාදේශීය ලේකම් වරයා
- වතු අධිකාරී (වතු පදිංචිකරුවන්)
- පාසල් අයදුම්කරුවන් අදාල පාසලේ විදුහල්පතිවරයා හෝ පරිවෙනාධිපති හිමි (මුල් වරට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා)

**අයදුම්පත් භාර ගැනීම.**

- වයස අවු 20ට අඩු මුල්වරට හැඳුනුම්පතක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ
- පැරණි හැඳුනුම්පත සංශෝධනය කර ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ

- දෙපාර්තමේන්තු ලේඛන කඩිනමින් සොයා ගත හැකිවන, නැතිවූ හැඳුනුම්පත් සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ

**හැඳුනුම්පත් නිකුත් කිරීම**

මෙම සේවයට අයදුම්පත් යොමු කිරීමට හා හැඳුනුම්පත් ලබාගැනීමට අයදුම්කරු පැමිණීම අනිවාර්ය වන නමුත් එසේ පැමිණිය නොහැකි අවස්ථාවන්හි දී ඥාතීත්වය තහවුරු කරන ලේඛනයක් ඇති පවුලේ සාමාජිකයෙකුහට (මව/පියා/දරුවන්/ස්වාමියා/බිරිඳ) හෝ අයදුම්කරු විසින් බලය පැවරූ ලිපියක් ලබාදුන් අයකුට හැඳුනුම්පත ලබා ගැනීමට හැකියාව ඇත.

ඉන්දීය සම්භවයක් ඇති පුද්ගලයන්ගේ ඉල්ලීම මත පුරවැසිභාවය තහවුරු කිරීමේ සහතික පත් නිකුත් කිරීම

**1988 අංක 39 හා 2003 අංක 35 දරණ පනත් යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය හිමි වූ තැනැත්තන්ට ඔවුන්ගේ ඉල්ලීම මත පුරවැසිභාවය තහවුරු කිරීමේ සහතික පත් නිකුත් කිරීම**

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

පුරවැසි නීතිය ක්‍රියාත්මක වීමට පෙර (1948.11.15 දිනට පෙර) සිට ශ්‍රී ලංකාවාසීව සිටින ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තෙකු වීම හෝ එබඳු අයගෙන් පැවතෙන්නෙකු වීම

**නීතිය**
(i) 1988 අංක 39 දරණ ආදේශකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා ඊට අදාළ සංශෝධන
(ii) 2003 අංක 35 දරණ ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා ඊට අදාළ සංශෝධන
(iii) 2003 අංක 35 දරණ පනතේ 2 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රකාශන පත්‍ර ඉදිරිපත් කරන ඉන්දිය ගමන් බලපත්‍රධාරී තැනැත්තන්ට ඒ බව දැනුම දීමේ ලිපි නිකුත් කිරීම.

| අයදුම්පත් අංකය | විස්තරය |
|---|---|
| (I) IC/C/SPA | 1988 අංක 39 දරණ පනත යටතේ ඉදිරිපත් වන පුරවැසි සහතික ලබා ගැනීමේ අයදුම්පත |
| (II) C/P/I/O/2003/01 | 2003 අංක 35 දරණ පනත යටතේ ඉදිරිපත් වන පුරවැසි සහතික ලබා ගැනීමේ අයදුම්පත |
| (iii) C/P/I/O/2003/02 | 2003 අංක 35 දරණ පනතේ 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය ලබා ගැනීම මනාපය පල කරමින් ඉන්දිය ගමන් බලපත්‍රධාරී තැනැත්තන් විසින් ඉදිරිපත් කෙරෙන විශේෂ ප්‍රකාශය |

**අයදුම්පත් ලබා ගැනීම හා භාරදීම**

කොමසාරිස්,
ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 41,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

**අයදුම්පත සමග ඉදිරිපත් කල යුතු ලේඛන**

(i) උපැන්න සහතිකයේ පිටපතක්
(ii) ජාතික හැඳුනුම්පතේ පිටපතක් (තිබේ නම්)
(iii) විවාහ සහතිකයේ පිටපතක් (තිබේ නම්)
(iv) මවුපියන්ගේ පුරවැසි සහතික වල පිටපත් (තිබේ නම්)

උප්පැන්න සහතිකය, විවාහ සහතිකය නැති නම් පමණක් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කරන්න.
දරුවෙකුගේ උප්පැන්න සහතිකය සමග අයදුම්කරුගේ විවාහය සහිතක කරන දිවුරුම් ප්‍රකාශයක්

**ඉන්දියානු ගමන් බලපත්‍රධාරි තැනැත්තන්ට පමණක් අදාළ වන විශේෂ ලියවිලි**

(i) ඉහත කී 2 වන වගන්තිය යටතේ වූ විශේෂ ප්‍රකාශනයට අදාළව දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල දැනුම් දීමේ ලිපියේ පිටපතත්
(ii) අයදුම්කරු විසින් අවසාන වරට ලබාගත් ඉන්දියානු ගමන් බලපත්‍රයේ පැහැදිලි පිටපතක්

**අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

(i) 1988 අංක39 පනතට අදාලව අයදුම්කරුවන් (උපදෙස් සඳහා 1988/01 පත්‍රිකාව බලන්න)
(ii) 2003 අංක 35 පනතට අදාලව අයදුම්කරුවන් (උපදෙස් සඳහා 2003/01 උපදෙස් පත්‍රිකාව බලන්න.)

**පුරවැසි සහතිකයක් නිකුත් කිරීමට ගත වන කාලය**

නිතිය අනුව නියමිත කාලය අයදුම්පත ලැබීමේ දින සිට දින 60 කි.
අඩුපාඩු රහිතව නියමිත උපදෙස් වලට අනුකූලව අයදුම්පත් ඉදිරිපත් වන්නේ නම් දින 30 ගතවීමට පෙර අදාල සහතික නිකුත් කරනු ලැබේ.

**අයදුම්පත් භාරදිය හැකි වේලාවන්**

රාජකාරි වේලාවන් - සතියේ වැඩකරන දින වල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා
සති අන්තයේ හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල කාර්යාලය වසා තබනු ලැබේ.